ඇල්ල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

-------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 22 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 21 දිනද, සභාපතිවරයාට යවා ඇත.

1.2. <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු.3,453,397 ක් වුවද එය රු.4,634,309 ක් ලෙසට දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ආ) <u>නොසැසඳීම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.9,680,602 ක් සහ සේවක ණය ලේඛනය අනුව රු.10,163,369 ක් වූයෙන් රු.482,767 ක වෙනසක් විය. | ගිණුම්ශේෂ සැසඳිය යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.382,686,695 ක් වටිනා ගිණුම් විෂයයන් 08 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන, තක්සේරු වාර්තා හා හිමිකම් තහවුරු කිරීමේ ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදි සාක්ෂි ඉදිරිපත් කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ 8(1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2016 වර්ෂයේ සිට 2019 දක්වා ඉදිකළ අනවසර ඉදිකිරීම් 58 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පණතේ (II)කොටස 10(1)(ආ)(උ) උපවගන්ති | ඇල්ල නගරයේ ස්ථාපිත සංචාරක හෝටල්, ලැගුම්හල් හා වෙනත් ස්ථානවල මලඅපද්‍රව්‍ය විවෘත පරිසරයට බැහැර කර තිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,560,686 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.101,893 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 4,685,000 | 5,225,452 | 2,795,045 | 2,430,407 | 4,478,630 | 4,476,584 | 2,919,985 | 1,556,598 |
| ii. | කුලී | 2,085,280 | 1,025,116 | 720,160 | 304,956 | 2,200,000 | 1,474,116 | 829,476 | 644,640 |
| iii | බලපත්‍ර ගාස්තු | - | 1,993,005 | 1,993,005 | | - | 2,525,800 | 2,525,800 | - |
| iv | වෙනත් ආදායම් | 3,895,550 | 3,011,400 | 2,420,696 | 590,704 | 3,845,000 | 2,528,998 | 2,282,090 | 246,908 |
| | එකතුව | 10,665,830 | 11,254,973 | 7,928,906 | 3,326,067 | 10,523,630 | 11,005,498 | 8,557,351 | 2,448,146 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසරකට වැඩි කාලයක සිට පැවත එන රු.5,216,687 ක් වු හිඟහිටි වරිපනම් ගාස්තු අය කරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් ගාස්තු අය කරගත යුතුවේ. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වසර 02කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ආදායම් ණයගැතියෝ රු.31,867,245 ක් හා කර්මාන්ත ණයගැතියෝ රු.3,006,140 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ උසාවි දඩ රු.2,637,960 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.11,552,584 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | හිඟ උසාවි දඩ ගාස්තු හා හිඟ මුද්දර ගාස්තු වලින් වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1. <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අතුරු ව්‍යවස්ථා 04 ක් පනවා හෝ වැළඳගෙන නොතිබුණි. | මෙතෙක් වැළඳගෙන නොමැති අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 දෙසැම්බර් 31 දිනට අතුරු ව්‍යවස්ථා 4 වැළඳ ගැනීමට කටයුතු කරමි. |

**(ආ) <u>තිරසර සංවර්ධනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ක්‍රියාත්මක කිරිමට සටහන් තබා ගතිමි. |

**(ඇ) <u>පාරිසරික ගැටළු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ ප්‍රතිචක්‍රීයකරණ හා මලඅපද්‍රව්‍ය බැහැර කිරීමේ කළමනාකරණ ස්ථානයක් පිහිටුවීම සඳහා අක්කර 5 ක ඉඩමක් ලබාදී ශක්‍යතා අධ්‍යන වාර්තා සකස් කර අනුමත කර තිබුණද, එම කළමනාකරණ මධ්‍යස්ථානය ඉදි නොකර ඇල්ල නගරයේ ක්‍රීඩා භූමියේ තැනින් තැන කසළ බැහැර කර තිබුණි. | විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | කඩිනමින් එම ප්‍රදේශයේ කසළ කළමනාකරණ කටයුතු ආරම්භ කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------------ | ---------------------- | ----------------------------- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය ක්‍රමවත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය ක්‍රමවත්ව හා යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. | යාවත්කාලීනව පිළියෙල කිරිමට කටයුතු කරමි. |
| (ආ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන වියදම් ණයහිමි හා කර්මාන්ත ණයහිමි රු.6,984,352 ක් නිරවුල් කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුවේ. | නිරවුල් කිරිමට කටයුතු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------------------------- | ------------------------- | ------------------ |
| පානීය ජල යෝජනාක්‍රම 18 ක් මඟින් ජල සම්බන්ධතා 1357 ක් ලබාදී තිබුණු අතර,ඉන් ජල සම්බන්ධතා 515 ක් සඳහා ජල මනු සවිකිරීමකින් තොරව ස්ථාවර ගාස්තු අයකර තිබුණි. | ජල මනු සවිකර ජල පරිභෝජන ගාස්තු අයකර ගත යුතුවේ. | ජල මනු සවි කිරිමට කටයුතු කරමි. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------------- | ------------------------ | -------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 17ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු සඳහා ඉල්ලීම් කර ඇත. |

## 3.5 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වසර සඳහා පිළියෙල කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක්වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරි වර්ෂයේදි විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පවත්වමි. |